ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
Regional Development Bank

ටෙන්ඩර් ආකෘති පත්‍රය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව නුගේගොඩ ශාඛාවේ

ණය මුදලක් වෙනුවෙන් බැංකුවට පවරා ගන්නා ලද

“පිල්ලගොඩබැද්ද නැමැති ඉඩමේ කැබලි අංක B දරණ”

ගොඩනැගිල්ලක් සහිත අක්කර :00 රූඩ් :00 පර්චස් : 39 විශාල ඉඩම

ටෙන්ඩර් අංකය HBO/PROC/RDB/AUC/2026/02

ඉල්ලුම්කරුගේ නම:

ලිපිනය:

දුරකතන අංකය:

ඉල්ලුම් කරන දේපළෙහි විස්තර:

ඉල්ලුම් කරන දේපළෙහි ප්‍රමාණය: අක්. 00 රූඩ්. 00 පර්. 39

ඉල්ලුම් කරන මිල රු.(අකුරින්): ....

ඉලක්කමින් : ....

ඉහළම මිලක් ඉදිරිපත් කරන පුද්ගලයා මා වුවහොත් ටෙන්ඩරය පිළිගත් බව දැනුම් දුන් දින සිට දින 14 ක් තුළ ගැණුම් මිලෙන් 25% ක මුදලක් ගෙවීම සහ ටෙන්ඩරය පිළිගත් බව දැනුම් දුන් දින සිට මාසයක් ඇතුළත ඉතිරි මුදල ගෙවීමට පොරොන්දු වෙමි.

ටෙන්ඩර් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සතු අයිතියක් බව පිළිගන්නා අතර, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ඉදිරිපත් කර ඇති අනෙකුත් ටෙන්ඩර් කොන්දේසි පිළිගැනීමට එකග වෙමි.

මෙයට විශ්වාසී,

....
අත්සන

....
ජාතික හැඳුනුම්පත් අංකය

ටෙන්ඩර් කොන්දේසි සඳහා අනෙක් පිට බලන්න.

ටෙන්ඩර් කොන්දේසි

1. ටෙන්ඩර්පතක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ද කිසියම් ටෙන්ඩරයක් ,කොටසක් හෝ සියළුම ටෙන්ඩර්පත් අවලංගු කිරීමේ බලය ද ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සතුය.
2. 2026.11.10 දින ප.ව 2.00 න් පසු ටෙන්ඩර්පත් භාරගනු නොලබන අතර එදින ප.ව.3.00 න් පසු ටෙන්ඩර් පෙට්ටිය විවෘත කරනු ලැබේ. .
3. රු.2,500.00ක මුදලක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව නුගේගොඩ ශාඛාවෙන් තැන්පත් කර එකී ලදුපතෙහි ඡායා පිටපතක් ටෙන්ඩර් පත්‍රයට අමුණා එවිය යුතු අතර එම දේපළ විකුණා අවසන් කිරීමෙන් පසු එම තැන්පත් මුදලින් රු. 1500.00 ක් ආපසු ගෙවනු ඇත.නුගේගොඩ ශාඛාවට යාම අපහසු ඉල්ලුම්කරුවන් දු.අං.011-2821030/35,071-2817614/071-3382396 විමසා මුදල් තැන්පත් කිරීමේ කටයුතු කරගත හැක.
4. ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබා ගන්නා අය තමා නමින්ම ටෙන්ඩර්පත් ඉදිරිපත් කල යුතුය.ටෙන්ඩර්පත් ඍජුවම ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ප්‍රධාන කාර්යාලය වෙත පැමිණ භාරදීම හෝ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.අයදුම්පත්‍රය පුරවා බැංකු ශාඛාවන් වෙත භාරදීම නොකල යුතු අතර එලෙස එවනු ලබන ටෙන්ඩර්පත් භාර නොගැනේ.
5. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී කවරයේ ඉදිරිපස වම් කෙළවරෙහි "පීල්ලගොඩබැද්ද" නැමැති ඉඩමේ කැබලි අංක B දරණ" යන්න සහ ටෙන්ඩර් අංකය **HBO/PROC/RDB/AUC/2026/002** මිලදී ගැනීම යනුවෙන් සඳහන් කල යුතුය.
6. නිසි පරිදි සම්පූර්න කරන ලද ටෙන්ඩර් පත්‍රය **සහකාර සාමාන්‍යාධිකාරී - ණය අයකිරීම් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, මහර ප්‍රධාන කාර්යාලය ,නුවර පාර,මහර හන්දිය,කඩවත** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මහර ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලීම කල හැක.
7. දේපළ සඳහා ඉහළම මිල ගණන් සඳහන් ටෙන්ඩරය ඉදිරිපත් කර ඇති අය එම දේපළෙහි ඉල්ලුම්කරු වශයෙන් පිළිගනු ලැබේ.
8. ටෙන්ඩරය පිළිගත් බවට දැනුම් දීම ලැබීමෙන් පසු දින 14 ක් තුළ ගැණුම් මිලෙන් 25% ක මුදලක් ගෙවීම සහ මාසයක කාල සීමාවක් තුළ ඉතිරි සම්පූර්ණ මුදල ගෙවා නිම කල යුතුය. එම කාල සීමාව තුළ සම්පූර්ණ මුදල ගෙවීමට අපොහොසත් වුවහොත් තැන්පත් කල මුදල ගෙවනු නොලැබේ.
9. නියමිත දිනයේදී මුදල තැන්පත් කිරීමට අපොහොසත් වුවහොත් දෙවැනියට ඉහළ මිලක් ඉදිරිපත් කර ඇති අය ගැණුම්කරු වශයෙන් පිළිගනු ලබන අතර මුල් ගැණුම්කරු තැන්පත් කර ඇති මුදල ආපසු ගෙවනු නොලැබේ.
10. දෙවන ගැණුම්කරු දැනුම් දීම ලැබීමෙන් පසු මාසයක් තුළදී මුළු මුදල ගෙවිය යුතුය.
11. ටෙන්ඩරය විවෘත කරන අවස්ථාවේදී ඉල්ලුම්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගී විය හැකි අතර ඉහළ මිල ගණන් සඳහන් කර ඇති අයට ටෙන්ඩරය පිළිගැනීමෙන් පසු ලියාපදිංචි තැපෑලෙන් ඒ බව දැනුම් දෙනු ඇත.
12. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වෙනත් කොන්දේසි ඉදිරිපත් කිරීමට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සතු අයිතියක් ලෙස පිළිගත යුතුය.
13. ටෙන්ඩර් කැඳවනු ලබන දේපළෙහි ඔප්පු සහ හිමිකම් පරීක්ෂා කිරීමට අවශ්‍ය ලේඛණ හා අනෙකුත් විස්තර ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරී ණය අයකිරීම් වෙතින් හෝ කලමනාකරු නුගේගොඩ ශාඛාව වෙතින් විමසා පරීක්ෂා කල යුතුය.
14. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට පෙර ටෙන්ඩර් අයදුම්කරු විසින් දේපළෙහි සාමාන්‍ය තත්වය සහ නීතිමය තත්වය සම්බන්ධයෙන් සෑහීමකට පත්වී තිබිය යුතුය.
15. ටෙන්ඩර් මගින් දේපළ මිලදී ගන්නා අය විකුණුම් සහතිකයන් ලබා ගැනීමේදී අදාළ ගාස්තු ගෙවිය යුතුය.
16. ඉහත සඳහන් නීති හා කොන්දේසි වලට අනුකූල නොවන ටෙන්ඩර්පත් අවලංගු වූවා සේ සැළකේ.
17. ටෙන්ඩර් පත්‍රිකාවේ මිල සඳහන් කිරීමේදී අකුරින් සහ ඉලක්කම් වල වෙනසක් වුවහොත් එහිදී අකුරින් සඳහන් මිල පිළිගනු ලැබේ.

සහකාර සාමාන්‍යාධිකාරී - ණය අයකිරීම්
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව